# ආරක්ෂක අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## මිළ ගණන් කැඳවීමයි

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලිහිසි තෙල් සහ ග්‍රීස් සැපයීම සහ බෙදා හැරීම සඳහා ප්‍රසම්පාදනය - 2025

### කොන්ත්‍රාත් හඳුනාගැනීමේ අංකය. *SLA/S&T/03/ LUB & OIL/2025(14)*

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත, ලිහිසි තෙල් සහ ග්‍රීස් වර්ග මිල දී ගැනීමේ ප්‍රසම්පාදන වෙනුවෙන්, ආරක්ෂක අමාත්‍යාංශය ප්‍රසම්පාදනය කමිටුවේ (MPC) සභාපති විසින් **2025 මාර්තු මස 01 දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා** කාලසීමාව තුළ රත්මලාන ස්වාධීන සැපයුම් ගබඩාව වෙත ලංසු කැඳවනු ලැබේ.

2. ලංසු කැඳවීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 හි ඡේද 3.1.2 ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු ක්‍රමය තුළින් සිදු කරනු ලැබේ. ලංසු තැබිය හැක්කේ දේශීය ලංසුකරුවන්ට පමණි. ලංසු ලේඛනය තුළ ලිහිසි තෙල් (Lubricant Oil) සහ ග්‍රීස් අයිතමවල පිරිවිතරයන් සහ විස්තර සපයනු ලැබේ.

**3. එක් එක් අයිතම/ කාණ්ඩ යටතේ ලිහිසි තෙල් සහ ග්‍රීස් අයිතම සඳහා ලංසු ඉදිරිපත් කිරීම.**

3.1 ඉදිරිපත් කරන සියලුම ලංසු අයිතම / කාණ්ඩ යටතේ වෙන වෙනම ඉදිරිපත් කළ යුතු අතර, එයට අදාළ සියලුම අයිතම සඳහා වෙන වෙනම මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් වන ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

3.2 මිලදී ගන්නා විසින් ඇගයීමට ලක් කෙරෙනු ඇති ලංසුකරුවාගේ හැකියාව අනුව ඕනෑම ලංසුවකට අයිතම හෝ කාණ්ඩ වශයෙන් ලංසු ඉදිරිපත් කළ හැකි අතර, අදාළ අයිතම වර්ග වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය. පහත සඳහන් කාණ්ඩ සඳහා එය වලංගු වේ.

**3.2.1 A කාණ්ඩය - ලිහිසි තෙල් ද්‍රව්‍ය සැපයීම (අයිතම පදනම මත ප්‍රසම්පාදනය)**

මෙම කාණ්ඩය ලංසු 06 කින් සමන්විත වන අතර වෙනම ප්‍රසම්පාදන ලෙස සලකනු ලැබේ. ඇගයීම් සහ තේරීම් ක්‍රියාවලිය එක් එක් අයිතම අනුව වෙන වෙනම ක්‍රියාත්මක කරනු ලැබේ. (ඇමුණුම i)

**3.2.2 B කාණ්ඩය - ලිහිසි තෙල්, තෙල් සහ ග්‍රීස් අයිතම සැපයීම (කාණ්ඩ මත ප්‍රසම්පාදනය)**

මෙම කාණ්ඩය ලංසු 07 කින් සමන්විත වන අතර ලංසුවක අයිතම කිහිපයක් ඇතුලත් වේ, මෙය වෙනම ප්‍රසම්පාදනයක් ලෙස සලකනු ලැබේ. ඇගයීමේ හා තේරීමේ ක්‍රියාවලිය විශේෂිත කාණ්ඩය වෙන වෙනම සිදු කරනු ලැබේ. (ඇමුණුම i)

4. ලංසුකරුවා අසාධු ලේඛනගතව නොසිටිය යුතු අතර, පහත අවම යෝග්‍යතා නිර්ණායක සැපිරිය යුතු ය.

4.1 ආසන්නතම මූල්‍ය වර්ෂ 02 ඇතුළත ඕනෑම මූල්‍ය වසර 1 ක් සඳහා අදාළ ලිහිසි තෙල් සහ ග්‍රීස් සැපයුම් ක්ෂේත්‍රයේ අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 02 ක් විය යුතු අතර, අදාළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මගින් තහවුරු කළ යුතුය.

4.2 අවම වශයෙන් රු.මිලියන 1ක ද්‍රවශීල වත්කම් (අතැති මුදල්, බැංකුවේ මුදල්, කෙටි කාලීන ආයෝජන සහ ලැබිය යුතු ගිණුම්) ඇති බව 2023/ 2024 මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව තහවුරු කළ යුතුය.

4.3 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත දැනට ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් හෝ මූල්‍ය ආයතන විසින් (මෙම ටෙන්ඩරය සඳහාම) සපයනු ලබන අවම ණය සීමාව රුපියල් මිලියන 1 (A කාණ්ඩයේ අයිතම අංක 04 සහ B කාණ්ඩයේ සියලුම ලංසු සඳහා පමණයි) විය යුතුයි.

4.4 ලිහිසි තෙල් සහ ග්‍රීස් සැපයීම පිළිබඳ වත්මන් කොන්ත්‍රාත්තු ඇතුළුව පසුගිය වසර තුන (3) තුළ වසරක ලිහිසි තෙල් සහ ග්‍රීස් සැපයීම පිළිබඳ අතීත සමාන අත්දැකීම් ඇමුණුම V (ආකෘතිය 01) අනුව ඉදිරිපත් කළ යුතු ය. සහතික කළ පිටපත් අමුණා තිබිය යුතුය.

5. ලංසු ලේඛන නිකුත් කිරීම, ඉදිරිපත් කිරීම සහ භාරගැනීම අවසන් කිරීම සඳහා වන දින පහත පරිදි වන අතර, අදාළ ලංසුකරුවන් හෝ බලයලත් නියෝජිතයන්ට ලංසු විවෘත කිරීමට සහභාගි විය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| | | |
|---|---|---|
| අ. ලංසු ලේඛන නිකුත් කිරීම ආරම්භ කිරීම | - | 2025.01.20 |
| ආ. ලංසු ලේඛන නිකුත් කරනු ලබන අවසාන දිනය සහ වේලාව | - | 2025.02.10 දින ප.ව.3.00 දක්වා |
| ඇ. ලංසු ඉදිරිපත් කළ යුතු/ මුද්‍රා තබන අවසාන දිනය සහ වේලාව | - | 2025.02.11 දින පෙ.ව.11.00 දක්වා |
| ඈ. ලංසු විවෘත කරන ස්ථානය, දිනය සහ වේලාව | - | ආරක්ෂක අමාත්‍යාංශය, ප්‍රසම්පාදන අංශය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, 2025.02.11 දින පෙ.ව. 11.00 ට |

6. පූර්ව ලංසු රැස්වීමක් **2025.01.30 දින පෙ.ව.11.00 ට ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල** (යුද්ධ හමුදා මූලස්ථාන රථ ගාල) යන ස්ථානයේදී පැවැත්වේ.

7. නැවත ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් පසු 11 ඡේදයේ ඇති ලිපිනයේ **අධ්‍යක්ෂ ජෙනරාල්, සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂක මණ්ඩලය** වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ලියවුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිලදී ගත හැකිය. නැවත ගෙවනු නොලබන ගාස්තු, ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 2024 අත්පොත අනුගමන කර ඇත.

8. ලංසුකරුවන් ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලංසු ලේඛනයේ දක්වා ඇති පෝරම පමණක් භාවිතා කළ යුතුය. මුද්‍රා තබන ලද මුල් ලංසුව සහ මුද්‍රා තබන ලද පිටපත වෙන වෙනම එක් මුද්‍රා තබන ලද කවරයකට බහා, ඉහත 5 ඡේදය තුළ දක්වා ඇති දිනය හා වේලාවට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය, නැතහොත් ආරක්ෂක අමාත්‍යාංශය, ප්‍රසම්පාදන අංශ, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ යන ස්ථානයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය යුතුය.

9. **ලංසු 2025.05.15 දක්වා** වලංගු විය යුතුය.

10. ඉදිරිපත් කරනු ලබන ලංසුව සමග **2025.06.15** දක්වා වලංගු වන පරිදි ලංසු සුරක්ෂණයක් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් නමට ඉදිරිපත් කළ යුතු ය. එම ලංසු සුරක්ෂණ ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද (අදාල බැංකුවේ ලිපි ශීර්ෂය සහිතව) කොන්දේසි විරහිතව ඉල්ලුම මත ලබා දෙන ලංසු සුරක්ෂණය සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණ ඇපකරයෙහි වටිනාකම මිල දී ගැනීමේ මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 ප්‍රකාරව ලංසු ලේඛනයෙහි සඳහන් කර ඇත.

11. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, **සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂක මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල** (දුරකථන: +011 2302569, 011 2302568, **විද්‍යුත් තැපැල - dteofsuptender@gmail.com** ) වෙතින් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලේඛන කට්ටලය මිල දී ගත හැකි අතර **2025 ජනවාරි 20 සිට 2025 පෙබරවාරි 10 දින** දක්වා **සෑම වැඩ කරන දිනකම පැය 0900 සිට 1500 දක්වා සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂක මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල** වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කළ හැකි ය.

12. ලේඛනය පරීක්ෂා කිරීම/මිලදී ගැනීම සහ මූලස්ථානය සඳහා සහභාගී වන පුද්ගලයන්ගේ නම්, ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍ර අංක අදාල විස්තර ලංසු විවෘත කිරීමට දිනකට පෙර **අධ්‍යක්ෂ ජෙනරාල්, සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂක මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල** වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය. **(විද්‍යුත් තැපැල් : dtesandt0@gmail.com** දුරකථන: 011 2302569, 011 2302568)

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලිහිසි තෙල් සහ ග්‍රීස් සැපයීම සහ බෙදා හැරීම සඳහා ප්‍රසම්පාදනය - 2025**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
2025.01.19

SELACINE